**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ පවත්වාගෙන යන වත්කම් ලේඛණවලට අනුව රු.300,000 ක් වූ ඉඩම් තුනක වටිනාකම ගිණුම්වලින් අත්හැරීම් නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂ රු.300,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාවේ නිලධාරීන් / සේවකයින් 06 දෙනෙකුගෙන් මුදල් අයකර බැංකු ගිණුම්වල ආයෝජනය කර තිබුණු සේවක ඇප රු.28,105 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයෝජන ශේෂය හා ආපසු ගෙවිය යුතු තැන්පතු රු.28,105 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභාවට ලැබී තිබුණු රු.3,000,000 ක මුදලින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම හා දෙසැම්බර් 31 දිනට බැරකම් රු.3,000,000 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) පුරනැගුම ව්‍යාපෘතිය සඳහා හීල්ඔය ඉඩම් කොටස වෙන්කරවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වාණිජ අධිකාරි කාර්යාලය වෙත ගෙවිය යුතු රු.109,760 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන නොසැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැරකම් හා වර්ෂයේ වියදම රු.109,760 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලැබී තිබුණු බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් ගිණුම් ගත නොකිරීම නිසා, වත්කම් ගිණුම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂ රු.265,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 2014 අගෝස්තු 05 දින රු. 220,000 කට මිළදී ගත් ටයර් 06 ක් ගබඩාවේ තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින තොගයට ඇතුලත් කර නොතිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 36,059,207 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.28,786,581 ක් විය.

1.3.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

-----------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර, ස්ථාන මාරුවී ගිය හා සේවය හැර ගිය නිලධාරීන් / සේවකයින් 05 දෙනෙකුගෙන් 1996 සිට 2014 දක්වා කාලය තුල අයවිය යුතු රු.168,750 ක සේවක ණය අය කර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | සභාවේ මුදල් තැන්පත් කර වසර 02 ක් ඉක්ම වූ රු. 204,958 ක් වටිනා ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,916,499 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,833,282 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු.5,083,217 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**
---------------------

2.2.1 **ජල ගාස්තු**
-----------

සභාව විසින් නඩත්තු කර පවත්වාගෙන යන ජල යෝජනා ක්‍රම 06 ක පාරිභෝගිකයින් 125 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 507,215 ක හිඟ ජල ගාස්තු අය කරගෙන නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.4,562,839 ක උසාවි දඩ හා රු.10,072,800 ක මුද්දර ගාස්තු ආදායම් අයවිය යුතුව පැවතුණි.

**2.2.3 සන්නිවේදන කුළුණු ගාස්තු**
---------------------------

සභා බල ප්‍රදේශය තුල ස්ථාපනය කර ඇති සන්නිවේදන කුළුණුවලින් ආදායම් අයකර ගැනීම සඳහා ගැසට් පත්‍රයේ පලකර තිබුණද, එකී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය